

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 492

උපරිමාධිකරණ විනිශ්චයකාරවරු

பாராளுமன்றக் கூட்டத்தொடர் இல.: 492

மீயுயர் நீதிமன்றங்களின் நீதிபதிகள்

**Parliamentary Series No. – 492**

# Judges of the Superior Courts

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 492

ආයතනයේ නම :- උපරිමාධිකරණ විනිශ්චයකාරවරු - ශීර්ෂ අංක 04

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் : 492

நிறுவனத்தின் பெயர் : மீயுயர் நீதிமன்ற நீதிபதிகள் - தலைப்பு இல: 04

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Series No: 492

Name of the institution: Judges of the Superior Courts-Head No:04

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119(4)

**<u>පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 492</u>**

**<u>ආයතනයේ නම - උපරිමාධිකරණ විනිශ්චයකාරවරු</u>**

**<u>2023 මුදල් වර්ෂය - පළමු කොටස</u>**

| | කමිටුව මගින් හඳුනා ගත් දුර්වලතා | දුර්වලතා මග හරවා ගැනීම සඳහා ආයතනය මගින් ගත් පියවර/වර්තමාන තත්ත්වය |
|---|---|---|
| 01. | අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත. | 2026 වර්ෂයේ සිට පවත්වාගෙන යාමට කටයුතු කරමි. |
| 02. | සියලු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත. | යාවත්කාලීන කර ඇත. |
| 03. | සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුණි. | උපරිමාධිකරණ විනිසුරුතුමන්ලා භාවිතා කරනු ලබන නිල රථ සඳහා ලොග් පොත් පවත්වාගෙන යනු නොලැබේ.(ගරු විනිසුරුතුමන්ලාගේ පෞද්ගලික සහ රාජකාරි ආරක්ෂාව රැකගැනීම සඳහා ) |
| 04. | රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබුණි. | 2026 වර්ෂයේ සිට සියලු අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. පරීක්ෂණ සිදු කරනු ලැබේ. |
| 05. | මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී සතියක් ඇතුළත නිරවුල් කර නොතිබුණි. | මේ වන විට තත්කාර්ය අතුරු අග්‍රිමය මු.රෙ.371 ප්‍රකාරව නිරවුල් කර ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| 06. | වාර්ෂික කාර්යසාධන වාර්තාව නිසි පරිදි පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා කටයුතු ආරම්භ කර නොතිබුණි. | 2024/08/08 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. |
| 07. | මු. රෙ. 134 (2) ප්‍රකාරව විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේදි පිළියෙල කර නොතිබුණි. | උපරිමාධිකරණ විනිසුරු ශීර්ෂය සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් නොමැති බැවින් විගණන වැඩසටහන පිළියෙල කර නැත. අභ්‍යන්තර විගණක තනතුර අනුමත කර ගැනීම සඳහා මු.රෙ.71 ආකෘති පත්‍රය සම්පූර්ණ කර 2026.02.09 වැනි දින අධිකරණ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. |
| 08. | සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් නොමැති බැවින් කළමනාකරණ විගණන කමිටු රැස්වීම් පවත්වා නොතිබූ අතර 2026 වර්ෂයේ සිට කළමනාකරණ විගණන කමිටු රැස්වීම පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. |

15 .05.2026 වන දින,
ශ්‍රේෂ්ඨාධිකරණයේදීය.

රෙජිස්ට්‍රාර්
ශ්‍රේෂ්ඨාධිකරණය

මනෝදි හේවාවසම්
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්/
කොළඹ අතිරේක මහේස්ත්‍රාත්

## <u>පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - **492**</u>

## <u>ආයතනයේ නම - උපරිමාධිකරණ විනිශ්චයකාරවරු</u>

## <u>2023 මුදල් වර්ෂය - දෙවැනි කොටස</u>

| | කමිටුව මගින් හඳුනා ගත් දුර්වලතා | දුර්වලතා මග හරවා ගැනීම සඳහා ආයතනය මගින් ගත් පියවර/වර්තමාන තත්ත්වය |
|---|---|---|
| 01. | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | 2023 වර්ෂයට අදාලව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිලියෙල කර නොතිබූ අතර 2026 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කරමින් පවතී. |
| 02. | සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි. | ගරු අගවිනිසුරුතුමා ඇතුළු උපරිමාධිකරණ විනිසුරුවරුන් සඳහා පුහුණු වැඩසටහන් දේශීයව සිදුකරනු නොලබන අතර විදේශීය පුහුණු කටයුතු සඳහා 2023 වර්ෂයට ලබා දී තිබුණු ප්‍රතිපාදන ප්‍රමානවත් නොවීම මත එවැන්නක් සිදුකළ නොහැකි විය. |
| 03. | සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි. | උපරිමාධිකරණ විනිසුරුවරුන් සඳහා කාර්ය සාධන ගිවිසුම සකස් කරනු නොලැබේ. |
| 04. | මානව සම්පත් සංවර්ධන සැලැසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරයෙකු නම් කර නොතිබුණි. | මේවන විට ගරු උපරිමාධිකරණ විනිසුරුතුමන්ලාගේ පුහුණු වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුතුමෙකු පත්කර ඇත. |
| 05. | ආයතනය තම විෂය පථය අනුව තිරසර අරමුණු හඳුනාගෙන නොතිබුණි. | 2023 වර්ෂයේදී මෙම තොරතුරු හඳුනාගෙන නොතිබුණ අතර මේවනවිට ආයතනයට අදාල තිරසර සංවර්ධන ඉලක්ක හඳුනා ගෙන ඇත.ඒ අනුව තිරසර සංවර්ධන අරමුණු 8, 9 හා 16 කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් පහත කටයුතු ඉටු කරමින් පවතී.<br><br>**ගෞරවනීය රැකියා හා ආර්ථික වර්ධනයක් ඇති කිරීමත් , තාක්ෂණික හැකියාවන් වැඩිදියුණු කිරීම මගින් ශ්‍රේෂ්ඨාධිකරණය සම්පූර්ණයෙන් ඩිජිටල්කරණය කරා රුගෙන යාමට අවශ්‍ය පියවර ගැනීමත්, සාමය සාධාරණත්වය තහවුරු කරමින් ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් නීතියේ ආධිපත්‍ය ප්‍රවර්ධනය කිරීම හා සැමට සමාන යුක්තිය ලබා ගැනීමට ඇති අයිතිය තහවුරු කරමින් නීති හා ප්‍රතිපත්ති ප්‍රවර්ධනය හා බලගැන්වීමට අවශ්‍ය සියලු ක්‍රියාකාරකම් ඩිජිටල්කරණය හා සමගාමීව සිදුකරන බවත් ඒ අනුව ඉදිරියේදී ශ්‍රේෂ්ඨාධිකරණය ලිපිගොනුවලින් තොර පරිසර හිතකාමී ආයතනයක් කිරීමට සැලසුම් සකස්කර ඇති බවත් දන්වමි.** |
| 06. | හඳුනාගත් තිරසර අරමුණු ඉටු කර ගැනීම සඳහා ළඟා කර ගත යුතු ඉලක්ක තීරණය කර නොතිබුණි. | |
| 07. | හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක නියම කර නොතිබුණි. | |
| 08. | සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි. | ගරු අගවිනිසුරුතුමා ඇතුළු උපරිමාධිකරණ විනිසුරුවරුන් සඳහා පුහුණු වැඩසටහන් දේශීයව සිදුකරනු නොලබන අතර විදේශීය පුහුණු කටයුතු සඳහා 2023 වර්ෂයට ලබා දී තිබුණු ප්‍රතිපාදන ප්‍රමානවත් නොවීය. |
| 09. | විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. | ඉදිරිපත් කර තිබූ සියලු නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති අතර හැකි සෑම නිර්දේශයක්ම මේ වන විට ක්‍රියාත්මක කර ඇත. |

| | | |
|---|---|---|
| 10. | 2020.08.28 දිනැති අංක 02/2020 දරන රාජය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටු කළ යුතු කාර්යභාරය පැහැදි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කළ හැකි කාර්යසාධක දර්ශක 03ක් හඳුනාගෙන නොතිබුණි. | 2023 වර්ෂයේදී හඳුනාගෙන නොතිබූ අතර 2026 වර්ෂය සඳහා අදාල දර්ශක හඳුනාගෙන ඇත. |
| 11. | උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබුණි. | උපරිමාධිකරණ විනිසුරුතුමන්ලා සඳහා ස්ථානමාරුවීම් ක්‍රියාත්මක නොවේ. |

5 .05.2026 වන දින,
ශ්‍රේෂ්ඨාධිකරණයේදීය.

රෙජිස්ට්‍රාර්
ශ්‍රේෂ්ඨාධිකරණය

මංජුදි හේවාවසම්
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්/
කොළඹ අතිරේක මහේස්ත්‍රාත්